

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව හා ගිණුම් 2019

පටුන

අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය

1. ආයතනය 1

1.1 කෙටි හැඳින්වීම 1

1.2 ආයතනයේ අධ්‍යක්ෂවරයා 2

1.3 කළමනාකරණ මණ්ඩලය 2

1.4 මූල්‍ය කමිටුව 3

1.5 අධ්‍යයන මණ්ඩල 3

1.5.1 අධ්‍යයන මණ්ඩලය 3

1.5.2 විශේෂඥ මණ්ඩල 4

2. 2019 වර්ෂය තුළ අධ්‍යයන ක්‍රියාකාරකම් 6

2.1 ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය 6

2.1.1. අනුමත කළ නිර්දේශ විස්තර ප්‍රකාශන 6

2.1.2 ආංශික ප්‍රවේශ ක්‍රියාකාරකම් 6

2.2 සිද්ධ විශේෂඥ වෛද්‍ය උපාධිය 6

2.2.1. අනුමත කළ නිර්දේශ විස්තර ප්‍රකාශන 6

2.3 යුනානි විශේෂඥ වෛද්‍ය උපාධිය 7

2.3.1 අනුමත කළ විශය නිර්දේශ 7

3. පරිපාලන අංශ 8

3.1 පරිපාලන අංශය 8

3.2 මූල්‍ය අංශය 8

4. මානව සම්පත් දත්ත 9

4.1 අනුමත කාර්ය මණ්ඩලය සහ වර්තමාන කාර්ය මණ්ඩලය 9

4.2 ස්ථිර සේවකයින් 10

4.3 කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් 10

5. 2019 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 11

6. විගණකාධිපතිගේ වාර්තාව 33

7. විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුර 39

8. විගණන කමිටුවේ නිරීක්ෂණ 41

9. තිරසර සංවර්ධනය සඳහා යෝජනාව 43

අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය



ශ්‍රී ලංකාව බටහිර වෛද්‍ය ක්‍රමය හඳුන්වාදීමට බොහෝ කාලයකට පෙර සිට ඉතා පරිපූර්ණ වෛද්‍ය සත්කාර ක්‍රමයක ඉතිහාසයක් උරුම කර ගත් දිවයිනකි. ශ්‍රී ලංකාවේ මිහින්තලය ප්‍රදේශයේ දී ලෝකයේ ඓතිහාසික රෝහලක් පිහිටා තිබූ බවට පුරාවිද්‍යාත්මක සාක්ෂි තහවුරු කරයි. අප විසින් 2019 වර්ෂය සඳහා වූ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ මෙවැනි පසුබිමක් තුළ සිටිමිනි.

ප්‍රඥප්තිය 2017 වර්ෂයේ දී ගැසට් කරනු ලැබූව ද 2019 වර්ෂය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සමාරම්භක වර්ෂය ලෙස ද සැලකිය හැකිය. ආයතනයේ පළමුවැනි අධ්‍යක්ෂවරයා සහ කළමනාකරණ මණ්ඩලය පත් කිරීම 2019 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී සිදු කරනු ලැබූ අතර ඉන් අනතුරුව ආයතනය පිළිබඳ කටයුතු රැසක් ඉටු කරනු ලැබීය. අධ්‍යයන මණ්ඩල, විශේෂඥ මණ්ඩල, මූල්‍ය කමිටුව පත් කිරීම සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයෙක් සහ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යයාධිකාරීවරයෙක් ඇතුළු වෙනත් කාර්ය මණ්ඩල කාණ්ඩ බඳවා ගැනීම මෙම කටයුතුවලට ඇතුළත් විය.

ආයුර්වේද රෝහල සහ එහි කාර්ය මණ්ඩලය ආයතනයේ ශික්ෂණ කාර්යයන් සඳහා උපයෝජනය කර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ප්‍රදානය කිරීමත් සමඟ පශ්චාත් උපාධිධාරීන්ගේ සායනික පුහුණුව සඳහා මඟ සැලසුනි. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් සලසනු පිණිස විද්‍යායතන පරිශ්‍රයේ 5වැනි මහළ සහ බොරැල්ල ආයුර්වේද රෝහල තුළ ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කරන ලදී.

විද්‍යායතනයේ ශික්ෂණ කටයුතු ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය මූලිකාංග සම්පූර්ණ කරමින් සෙනෙට් සභාව මඟින් නිර්දේශ විස්තර ප්‍රකාශන අනුමත කරන ලදී. 2019 වසර තුළ දී විද්‍යායතනය ඉටු කළ කාර්යභාරය සහ විද්‍යායතනය තුළ පවත්වන ලද උත්සව පිළිබඳ වැඩිදුර විස්තර මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

මෙම වර්ෂය තුළ දී විද්‍යායතනයට විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා වූ මූලික අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට හැකි විය. එමෙන්ම විද්‍යායතනයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා එහි සේවක සංඛ්‍යාවේ ඉතිරි බඳවා ගැනීම් සහ අනෙකුත් ද්‍රව්‍ය ප්‍රසම්පාදනය වැනි අනෙකුත් වැඩිදියුණු කිරීම් සිදු කළ යුතුව ඇත. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙම නවමු ආකෘතියත් සමඟ වසර දහස් ගණනක් පැරණි දේශීය වෛද්‍ය සේවාවන්ට නව ජීවයක් එකතු කිරීමට ආයතනයට ඉතා ඉක්මනින්ම හැකිවනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු.

මහා. වසන්ත ගුණතුංග
වැඩ බලන අධ්‍යක්ෂ

1. ආයතනය

1.1 කෙටි හැඳින්වීම

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2017 දෙසැම්බර් මස 08 වැනි දිනැති, අංක 2048/46 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ප්‍රඥප්තිය යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ආයතනයක් ලෙස පිහිටුවා ඇති අධ්‍යාපන ආයතනයකි. ඒ අනුව එය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා මානව සම්පත් අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධි සහ යුනානි යන ප්‍රධාන ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධි ආයතන සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව ආයතනය දිවයිනට අවශ්‍ය කරන ශ්‍රම බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා යෝග්‍ය පියවර ගෙන ඇත.

2019 පෙබරවාරි මස 25වැනි දින පවත්වන ලද කළමනාකරණ මණ්ඩලයේ පළමුවැනි රැස්වීම පැවැත්වීමෙන් පසුව 2019 මාර්තු මාසයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. ආයතනය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දෙන තෙක් ආයතනය සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ බොරැල්ලේ පිහිටි ආයුර්වේද ශික්ෂණ රෝහලේ තාවකාලික ගොඩනැගිල්ලක ස්ථාපනය කර ඇත.

ආයුර්වේද, සිද්ධි සහ යුනානි විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා අධ්‍යයන මණ්ඩල, කළමනාකරණ මණ්ඩලය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සහා සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන ඇත. ඒ හා සමගාමීව, ආයතනය සඳහා ගොඩනැගිලි නවීකරණය සහ යන්ත්‍රසූත්‍ර ප්‍රසම්පාදනය වැනි යටිතලපහසුකම් සංවර්ධනයට ද පියවර ආරම්භ කර ඇත. ආයතනයේ මානව සම්පත් ශක්තිමත් කිරීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අධ්‍යක්ෂවරයා සහ එක් ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරවරයෙක් පිළිවෙලින් කොන්ත්‍රාත් පදනම සහ ස්ථිර පදනම මත පත් කර ඇති අතර ආයතනය සහ කොළඹ විශ්වවිද්‍යාලය මඟින් එක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිවරයෙක්, කළමනාකරණ සහකාරවරු තිදෙනෙක් සහ වැඩ සහායක නිලධාරීන් දෙදෙනෙක් පැවරුම් පදනම මත පත් කිරීමට කටයුතු කර ඇත.

1.2 විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා විද්‍යායතනයේ අධ්‍යක්ෂ වේ.

මහාචාර්ය ජයන්ත ජයවර්ධන මහතා (2019 පෙබරවාරි මස 11 සිට 2019 නොවැම්බර් මස 25 දක්වා) සහ වෛද්‍ය සේනක පිලපිටිය මහතා (2019 දෙසැම්බර් මස 12 සිට 2020 ජනවාරි මස 22 දක්වා) 2019 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරු ලෙස සේවය කර ඇත.

1.3 කළමනාකරණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක සහ අධ්‍යයන මණ්ඩලය වන අතර සෑම මාසයකදීම එහි රැස්වීම් පවත්වනු ලැබේ. කළමනාකරණ මණ්ඩලයේ පළමු වැනි රැස්වීම 2019 පෙබරවාරි මස 25වැනි දින පවත්වන ලද අතර අඛණ්ඩ රැස්වීම් නමයක් (09) සහ එක් විශේෂ රැස්වීමක් එම වසර තුළ දීම පවත්වන ලදී.

2019 වසර තුළ දී පහත දැක්වෙන සාමාජිකයින් කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් විය.

මහා. ජයන්ත ජයවර්ධන	- අධ්‍යක්ෂ
වෛද්‍ය සේනක පිලපිටිය	- වැඩබලන අධ්‍යක්ෂ (2019 දෙසැම්බර් 12 සිට)
නිශාන්ති ජයසිංහ මෙය	- අතිරේක ලේකම් (සංවර්ධන) ආයුර්වේද අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය
කේ. ඩී. කුමාරතුංග මහතා	- ආයුර්වේද කොමසාරිස්
මහා. පී. ඒ. පරනගම මහත්මිය	- අධ්‍යක්ෂ, IIM
වෛද්‍ය වී. සෙල්වනාදන්	- විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යාචාර්ය (සිද්ධ)
මහා. ජයන්ත වැලිහිද	- වි.ප්‍ර.කොා.ස. නම් කළ නිලධාරී
ටී. ධර්මරාජා මහතා	- වි.ප්‍ර.කොා.ස. නම් කළ නිලධාරී
අනිල් රාජකරුණා මහතා	- වි.ප්‍ර.කොා.ස. නම් කළ නිලධාරී
හේමාල් කස්තුරිආරච්චි මහතා	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
වෛද්‍ය විවියන් සතියසීලන්	- ප්‍රධානී, සිද්ධ වෛද්‍ය අංශය, UoJ
වෛද්‍ය ටී. වීරරත්න	- විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යාචාර්ය, (ආයුර්වේද)
වෛද්‍ය විජිතා පතිරතන මහත්මිය	- ප්‍රධානී, සිද්ධ වෛද්‍ය අංශය, ත්‍රිකුණාමලය මණ්ඩපය
වෛද්‍ය ජේ. සී. කේ. ඩී. කුමාරසේකර මහත්මිය	- අධ්‍යක්ෂ/BMARI
මහින්ද මඩිහහේවා මහතා	- වි.ප්‍ර.කොා.ස. නම් කළ පාලක මණ්ඩල සාමාජික
ඩබ්ලිව්. එන්. නිමාලි ද සිල්වා මහත්මිය	- අධ්‍යක්ෂ (සංවර්ධන), MOHE
මහා. ගුණපාල අමරසිංහ මහතා	- වි.ප්‍ර.කොා.ස. නම් කළ නිලධාරී

1.4 මුදල් කමිටුව

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය කමිටුවේ පළමුවැනි රැස්වීම 2019 ජුනි මස 03වැනි දින පවත්වන ලද අතර 2019 වසර තුළ දී මූල්‍ය කමිටුවේ රැස්වීම් තුනක් (03) පවත්වන ලදී.

2019 වසර තුළ දී මූල්‍ය කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් විය.

මහා. ජයන්ත ජයවර්ධන මහතා	- අධ්‍යක්ෂ
මහා. පී. ඒ. පරනගම මහත්මිය	- අධ්‍යක්ෂ, IIM
ටී. ධර්මරාජා මහතා	- වි.ප්‍ර.කොා.ස. නම් කළ නිලධාරී
හේමාල් කස්තුරිආරච්චි මහතා	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව

1.5 අධ්‍යයන මණ්ඩල

අධ්‍යයන කටයුතු, පුහුණු වැඩසටහන් සහ විභාග කටයුතු පිළිබඳ තීරණ කළමනාකරණ මණ්ඩලයේ සහ සෙනෙට් සභාවේ අනුමැතියට යටත්ව, අධ්‍යයන මණ්ඩල (BOS) සහ විශේෂඥ මණ්ඩල (SpB) මඟින් ගනු ලැබේ. අධ්‍යයන මණ්ඩල සහ විශේෂඥ මණ්ඩලවල සියලුම රැස්වීම් සෑම මාසයකටම වරක් පවත්වනු ලැබේ.

1.5.1 අධ්‍යයන මණ්ඩල

ප්‍රඥප්තිය අනුව ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, යුනානි වෛද්‍ය ක්‍රමය සහ සිද්ධි වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයන මණ්ඩල සඳහා සාමාජිකයින් පත් කිරීම පෙබරවාරි මාසයේ දී සිදු කරන ලදී. 2019 මාර්තු මාසයේ දී සියලුම අධ්‍යයන මණ්ඩලවල පළමුවැනි රැස්වීම පවත්වන ලදී.

1.5.1.1 අධ්‍යයන මණ්ඩල

ආයුර්වේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
සිද්ධ පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
යුනානි පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

1.5.1.2 2019 වසරේ දී පවත්වන ලද අධ්‍යයන මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

මණ්ඩලයේ නම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
ආයුර්වේදය	12
සිද්ධ	4
යුනානි	8

1.5.1.2 අධ්‍යයන මණ්ඩලවල සභාපති සහ ලේකම් ධූරයන් – 2019

අධ්‍යයන මණ්ඩලය	සභාපති	ලේකම්
ආයුර්වේදය	වෛද්‍ය එස්. එම්. එස්. සමරකෝන්	වෛද්‍ය ඩබ්ලිව්. ජේ. වික්‍රමාරච්චි
සිද්ධ	වෛද්‍ය ඒ. ශ්‍රීදරන්	වෛද්‍ය එස්. ඌෂකාන්තන්
යුනානි	මහා. බී. එම්. නජීබ්	වෛද්‍ය ඒ. ඩබ්ලිව්. එස්. ෆවුසියා

1.5.2 විශේෂඥ මණ්ඩල (SpB)

2019 මාර්තු/ අප්‍රේල් මාසවල දී ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ (කායචිකිත්සා, ශල්‍ය තන්ත්‍ර, ස්ත්‍රීරෝග ප්‍රසූතිතන්ත්‍ර, කෞමාරභෘතය, ද්‍රව්‍යගුණ විඥාණ සහ ස්වස්ථවෘත්ත) යන විශේෂඥ මණ්ඩල හය ස්ථාපනය කරන ලද අතර ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ භයිසජ්‍ය කල්පනා සහ රාසශාස්ත්‍ර පිළිබඳ නව විශේෂඥ මණ්ඩලය පිහිටුවීම ජුනි මාසයේ දී සිදු විය. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ශාලක්‍ය පිළිබඳ නව SpB ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කරන ලදී.

සිද්ධ වෛද්‍ය ක්‍රමයේ (මරුතුවම් සහ ගුණපාදම්) විශේෂඥ මණ්ඩල දෙක 2019 මාර්තු/ අප්‍රේල් මාසවල දී ස්ථාපනය කරන ලදී.

යුනානි වෛද්‍ය ක්‍රමයේ (මෞලිජාත්) විශේෂඥ මණ්ඩලය 2019 මාර්තු/ අප්‍රේල් මාසවල දී ස්ථාපනය කරන ලදී.

ආයුර්වේදය
කෞමාරභෘතය පිළිබඳ විශේෂඥ මණ්ඩලය
කායචිකිත්සා පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ප්‍රසූතිතන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශල්‍ය තන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ස්වස්ථවෘත්ත පිළිබඳ විශේෂඥ මණ්ඩලය
භයිසජ්‍ය කල්පනා සහ රාසශාස්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශාලක්‍ය පිළිබඳ විශේෂඥ මණ්ඩලය

සිද්ධ
ගුණපාඩම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය
මරුතුවම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

යුනානි
මෞලිජාත් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

1.5.2.1 2019 වසරේ දී පවත්වන ලද විශේෂඥ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

මණ්ඩලයේ නම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
ආයුර්වේදය	
ශල්‍ය	8
කායචිකිත්සා	7
ප්‍රසූතිතන්ත්‍ර	7
ස්වස්ථවෘත්ත	7
ද්‍රව්‍යගුණ විඥාණ	1
බාල රෝග	7
භයිසජ්‍ය කල්පනා	3
ශාලක්‍ය	2

සිද්ධි	
ඖෂධවේදය	4
ඖෂධ	3
ගුණපාදම්	1
මරුතුවම්	1
යුනානි	
ඖෂධ	1
මොලිජිත්	3
ඖෂධවේදය	6

1.5.1.2 විශේෂඥ මණ්ඩලවල සභාපති සහ ලේකම් ධූරයන් – 2019

විශේෂඥ මණ්ඩල	සභාපති	ලේකම්
ආයුර්වේදය		
ශල්‍ය	වෛද්‍ය එල්. පී. ඒ. කරුණාතිලක	වෛද්‍ය බී. එම්. එස්. අමරජීව
කායචිකිත්සා	වෛද්‍ය එස්. එම්. එස්. සමරකෝන්	වෛද්‍ය කේ. ජී. සී. දිසානායක මහත්මිය
ප්‍රසූතිතන්ත්‍ර	වෛද්‍ය වයි. ඒ. යූ. ඩී. කරුණාරත්න මහත්මිය	වෛද්‍ය කේ. පී. කේ. ආර්. කරුණාගොඩ
ස්වස්ථවෘත්ත	වෛද්‍ය කේ. සී. පෙරේරා මහත්මිය	වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. එස්. කේ. කුලතුංග මහත්මිය
ද්‍රව්‍යගුණ විඥාණ	වෛද්‍ය එස්. ඩී. හපුආරච්චි මහත්මිය	
බාල රෝග	වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා	වෛද්‍ය ඕ. ටී. එම්. ආර්. ආර්. කේ. එස්. කලවාන
භයිසජ්‍ය කල්පනා	වෛද්‍ය එස්. කේ. එම්. කේ. හේරාපත්දෙනිය	
ශාලාක්‍ය	වෛද්‍ය කේ. පී. පී. පිරිස්	වෛද්‍ය බී. එම්. එස්. අමරජීව
සිද්ධ		
ගුණපාදම්	වෛද්‍ය එන්. වර්ණකුලේන්ද්‍රන්	වෛද්‍ය එන්. නිතියකුමාර්
මරුතුවම්	වෛද්‍ය ටී. කුමුත්‌රාජන්	වෛද්‍ය බී. උදයනන්
යුනානි	මහා. බී. එම්. නජීබ්	වෛද්‍ය ඒ. ඩබ්ලිව්. එස්. ෆවුසියා
මොආලිජිත්	වෛද්‍ය එම්. සී. එම්. මහීස්	වෛද්‍ය එම්. එච්. එම්. ෆලීල්ල

2. 2019 වසර තුළ අධ්‍යයන ක්‍රියාකාරකම

2020 වසරේ සිට අධ්‍යයන වැඩසටහන් ආරම්භ කිරීම පිණිස සමාලෝචිත වර්ෂය තුළ දී ආයුර්වේදය, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රම පිළිබඳ විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි වැඩසටහන්වල නිර්දේශ විස්තර ප්‍රකාශන සකස් කිරීම, සමාලෝචකයින් වෙත යැවීම සහ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සිදු කරන ලදී. මේ සඳහා ආයතනයේ අධ්‍යක්ෂවරයා, සියලුම අධ්‍යයන මණ්ඩල සහ විශේෂඥ මණ්ඩල සභාපතිවරු සිය උපරිම සහයෝගය ලබා දෙන ලදී. 2019 වසර තුළ දී අදාළ බලධාරීන් විසින් අනුමත කරන ලද පාඨමාලා විස්තර පහත දැක් වේ.

2.1 ආයුර්වේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධිය

2.1.1. අනුමත කළ නිර්දේශ විස්තර ප්‍රකාශන

කායචිකිත්සා පිළිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය, කෞමාරභෘතය පිළිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය, ආයුර්වේද ශාලක්‍ය තන්ත්‍ර පිළිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය, ස්ත්‍රී රෝග ප්‍රසූතිතන්ත්‍ර පිළිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය, ස්වස්ථවෘත්ත පිළිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය සහ එම උපාධි සඳහා මණ්ඩල සහතික සඳහා වූ අනුමැතිය ජුනි සහ ජූලි මාසවල දී ලබා ගෙන, සෙනෙට් සභාවට ඉදිරිපත් කරන ලදුව නොවැම්බර්/ දෙසැම්බර් මාසවල දී අනුමත කරන ලදී.

1) විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතික අනු-නීති, පොදු රෙගුලාසි, පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ මාර්ගෝපදේශ අගොස්තු/ සැප්තැම්බර් මාසවල දී කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කළ අතර සෙනෙට් සභාවට ඉදිරිපත් කරන ලදුව ඔක්තෝබර්/ නොවැම්බර් මාසවල දී අනුමත කරන ලදී.

2) විශේෂඥ වෛද්‍ය උපාධි 10 සහ මණ්ඩල සහතික අධ්‍යයන වැඩසටහන් සඳහා අවශ්‍ය කරන පුහුණු මධ්‍යස්ථාන විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාව මඟින් ජූලි/ අගෝස්තු මාසවල දී අනුමත කරන ලදී.

2.1.2 ආංශික ප්‍රවේශ ක්‍රියාකාරකම්

පුහුණුවන්නන් වෙන් කිරීම සඳහා අවශ්‍ය පුහුණු මධ්‍යස්ථානවලට අනුමැතිය ලබාදීම සඳහා පියවර ගෙන ඇත. තව ද, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි පුහුණු කටයුතු සඳහා අවශ්‍ය අවස්ථාවල දී විශේෂඥ වෛද්‍යවරු, වෙනත් කාර්ය මණ්ඩලය සහ ආයුර්වේද රෝහල උපයෝජනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගන්නා ලදී.

2020 වසරේ දී අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම පිණිස විශේෂඥ වෛද්‍ය උපාධි, මණ්ඩල සහතික අනු-නීති, රෙගුලාසි, පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ මාර්ගෝපදේශ සඳහා කළමනාකරණ මණ්ඩලයේ සහ සෙනෙට් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

2.2 සිද්ධ පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධිය

2.2.1. අනුමත කළ නිර්දේශ විස්තර ප්‍රකාශන

සිද්ධ ගුණපාඨම් පිළිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය, සිද්ධි මරුතුවම් පිළිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය සහ එම විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි වැඩසටහන්වල නිර්දේශ විස්තර ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය මඟින් සැප්තැම්බර් මාසයේ දී අනුමත කරන ලදුව සෙනෙට් සභාවට ඉදිරිපත් කළ අතර දෙසැම්බර් මාසයේ දී සෙනෙට් සභාව මඟින් අනුමැතිය ලබා දෙන ලදී.

2.3 යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධිය

2.3.1 අනුමත කළ නිර්දේශ විස්තර ප්‍රකාශන

යුනානි මොආලිජිත් පිළිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය සහ එම විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි වැඩසටහනේ නිර්දේශ විස්තර ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය මඟින් සැප්තැම්බර් මාසයේ දී අනුමත කරන ලදුව සෙනෙට් සභාවට ඉදිරිපත් කළ අතර දෙසැම්බර් මාසයේ දී සෙනෙට් සභාව මඟින් අනුමැතිය ලබා දෙන ලදී.

3. පරිපාලන අංශය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන වශයෙන් ආයතනයේ පරිපාලන අංශය සහ මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලැබේ.

3.1 පරිපාලන අංශය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන අංශය මඟින් සියලුම පරිපාලන කටයුතු සහ අධ්‍යයන කටයුතුවලට සම්බන්ධ ක්‍රියාකාරකම් පවත්වනු ලැබේ. කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සඳහා පරිපාලන සහයෝගය ලබාදීම, කොළඹ විශ්වවිද්‍යාලයේ සෙනෙට් මණ්ඩලයේ සහ පාලක මණ්ඩලයේ සහ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ලේඛන ඉදිරිපත් කිරීම, අධ්‍යයන වැඩසටහන් සහ ශිෂ්‍ය අවශ්‍යතා සම්බන්ධ ලේඛන පිළිබඳව අදාළ බලධාරීන් සමඟ කටයුතු කිරීම ආදිය සමාලෝචිත වර්ෂය තුළ දී පරිපාලන අංශය මඟින් ඉටු කරනු ලබන ක්‍රියාකාරකම් විය.

මෙයට අමතරව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය, අළුත්වැඩියා කටයුතු, ගොඩනැගිලි හා උපකරණ නඩත්තුව, කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා පොදු සේවාවන් සැපයීම, සේවා ප්‍රසම්පාදනය හා සන්නිවේදන පහසුකම් සැපයීම සහ ප්‍රවාහන සේවාවන් සැපයීම පරිපාලන අංශය මඟින් ඉටු කරන පරිපාලන කටයුතු අතර වේ. 2019 වසරේ දී කොළඹ විශ්වවිද්‍යාලය මඟින් කොන්ත්‍රාත් පදනම මත පත් කළ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී මෙම අංශයේ ප්‍රධානී ලෙස කටයුතු කළ අතර කළමනාකරණ සහකාරවරු දෙදෙනෙක් සහ වැඩ සහායක නිලධාරියෙක් පරිපාලන කාර්යයන් ඉටු කිරීමට සහාය විය.

3.2 මූල්‍ය අංශය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මූල්‍ය පරිපාලන සහ අයිතම ප්‍රසම්පාදනය, වාර්ෂික, කාර්තුමය හා මාසික අයවැය සකස් කිරීම, මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තා අදාළ බලධාරීන්ට යැවීම, ආයතනය මඟින් ලබා ගන්නා සියලුම සේවා සඳහා ගෙවීම් සිදු කිරීම, සුළු මුදල් කළමනාකරණය, චෙක්පත් නිකුත් කිරීම, වැටුප් ගෙවීම ආදී කටයුතු රාශියක් ඉටු කරනු ලබයි.

මෙයට අමතරව, සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන අයිතම, ද්‍රව්‍ය, පොත්, වාරසඟරා ආදිය ප්‍රසම්පාදනය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මඟින් කළමනාකරණය කරනු ලැබේ. 2019 වසරේ දී මෙම අංශය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ස්ථිර පදනම මත පත් කළ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයෙක් විසින් ප්‍රධානත්වය ගන්නා ලද අතර එක් කළමනාකරණ සහකාර නිලධරයෙක් සහ වැඩ සහායක නිලධරයෙක් අංශයේ කටයුතු ඉටු කිරීමට සහාය විය.

4. මානව සම්පත් දත්ත

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කළ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම 2019 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දුන් ප්‍රධාන අභියෝගයක් විය. වි.ප්‍ර.කොැ.ස. චක්‍රලේඛ අංක 876 ප්‍රකාරව සහ පුවත්පත් දැන්වීම් හරහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා පියවර ගනු ලැබුව ද ජනාධිපති මැතිවරණ කාලය තුළ රජයෙන් නිකුත් කළ චක්‍රලේඛ සහ අනධ්‍යයන සේවක වැඩවර්ජන හේතුවෙන් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එහි සේවක සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට හැකියාක් නොලැබුනි. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන සහ පරිපාලන වැඩකටයුතුවල සාර්ථකත්වය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම අභියෝගයක් වී ඇත.

4.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව නිලධාරීන් 16 දෙනෙක් වන අතර 2019.12.31 වැනි දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තරය පහත දැක්වෙන පරිදි වේ:

තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	වර්තමාන කාර්ය මණ්ඩලය
අධ්‍යක්ෂක	Academic		U-AC 5	ජ්‍යෙෂ්ඨ	1	*1
සහකාර පුස්තකාලයාධිපති	Academic		U-AC 3	ජ්‍යෙෂ්ඨ	1	0
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	UA&FS	II/I	U-EX 2	ජ්‍යෙෂ්ඨ	1	1
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි	UA&FS	II/I	U-EX 2	ජ්‍යෙෂ්ඨ	1	1
තාක්ෂණික නිලධාරී	UTS	III/II/I	U-MT 1	ද්විතියික	1	0
කළමනාකරණ සහකාර	UMAS	III/II/I	U - MN 1	ද්විතියික	5	**2
කළමනාකරණ සහකාර (පොත් තැබීම)	UMAS	III/II/I	U - MN 1	ද්විතියික	1	0
රියදුරු	UDS	III/II/I/Spl	U - PL 3	ප්‍රාථමික	3	0
වැඩ සහායක	UWAS	III/II/I/Spl	U - PL 1	ප්‍රාථමික	2	**1
එකතුව					**16**	**6**

***Acting Basis**
****Assignment Basis**

4.2 ස්ථිර සේවකයින්

නම	තනතුර	පත්වීම් දිනය
සී. පී. හතරසිංහ	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි	18.03.2019

4.3 කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින්

නම	තනතුර	පත්වීම් දිනය
අයි. කේ. කේ. විජේකෝන් මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/PGIIM	20.02.2019
සීලලතා මහත්මිය	කළමනාකරණ සහකාර	05.03.2019
සුමනා මහත්මිය	කළමනාකරණ සහකාර	15.06.2019
එල්. පී. ජයසේන මහතා	කළමනාකරණ සහකාර	01.07.2019
කල්දේරා මහතා	වැඩ සහායක	21.02.2020
පද්මසිරි මහතා	වැඩ සහායක	15.06.2019

5. 2019 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

2019 දෙසැම්බර් මස **31**වැනි දිනට	සටහන් අංකය	**2019** රු.
වත්කම්		
ජංගම වත්කම්		
මුදල් හා මුදල් සමාන දෑ	**3**	11,422,717
කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	**4**	80,000
බඩු ලේඛන/ තොග	**5**	117,133
මුළු ජංගම වත්කම්		11,619,850
ජංගම නොවන වත්කම්		
කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	**4**	260,000
දේපළ, පිරියත හා උපකරණ (ශුද්ධ)	**6**	2,865,218
මුළු ජංගම නොවන වත්කම්		3,125,218
මුළු වත්කම්		**14,745,068**
වගකීම්		
ජංගම වගකීම්		
උපචිත වියදම්	**7**	2,992,068
ගෙවිය යුතු	**8**	14,277
මුළු ජංගම වගකීම්		3,006,345
ජංගම නොවන වගකීම්		
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම්	**9**	438,776
මුළු ජංගම නොවන වගකීම්		438,776
මුළු වගකීම්		**3,445,121**
මුළු ශුද්ධ වත්කම්		**11,299,947**
ශුද්ධ වත්කම්/ සමකොටස්		
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	**10**	2,718,626
වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	**10**	3,142,594
MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන	**10**	8,759,378
සමුච්චිත අතිරික්තය/(හිඟය)	**11**	(446,530)
මුළු ශුද්ධ වත්කම්/ සමකොටස්		**14,174,068**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවේ ආයතනය නිකුත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස් කර, ඉදිරිපත් කර ඇත.

.....	.....
සී.පී. හතරසිංහ	ඩබ්ලිව්.එන්.පී.එම්.එන්.එන්. කරුණාරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් වගකිව යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය මඟින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....

මහාචාර්ය එම්. ඒ. ජේ. ඩබ්ලිව්. ජයවර්ධන

අධ්‍යක්ෂ

.....	.....
ටී. ධර්මරාජා	ටී. එන්. ඔසෙන්
කළමනාකරණ මණ්ඩලයේ සාමාජික	කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් නිරූපණය වේ. 10වැනි පිටුවේ සිට 23වැනි පිටුව දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

- ඉංග්‍රීසි පිටපතේ අත්සන් සටහන් කර ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

2019 දෙසැම්බර් මස **31**වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන් අංකය	**2019** රු.
ආදායම		
භාණ්ඩාගාරයෙන් ලැබූ පුනරාවර්තන ප්‍රදාන		9,051,000
වි.වි.කොෘ.ස. ලැබූ පුනරාවර්තන ප්‍රදාන		2,000,000
වෙනත් ආදායම්	**12**	21,317
ආදායම ක්‍රමක්ෂය	**13**	594,869
මුළු ආදායම		**11,667,186**
මෙහෙයුම් වියදම්		
පෞද්ගලික පඩිනඩි	**14-A**	6,283,317
ගමන් සහ යැපීම් දීමනාව	**14-B**	300
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	**14-C**	232,702
නඩත්තු වියදම්	**14-D**	37,780
කොන්ත්‍රාත් සේවා	**14-E**	3,733,387
වෙනත් පුවරාවර්තන වියදම්	**14-F**	1,231,360
ක්ෂය වියදම්	**14-G**	594,870
මුළු වියදම්		**12,113,716**
පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය)		**(446,530)**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

සමකොටස් / ශුද්ධ වත්කම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

2019 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා

(රු.)

	සමුච්චිත අරමුදල	වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන	**එකතුව**
2019 ජනවාරි මස 01වැනි දිනට ශේෂය		-	-		-
ප්‍රදාන ක්‍රමක්ෂය		(238,780)		(356,089)	(594,869)
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන			6,100,000	9,115,467	15,215,467
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන		2,957,406	(2,957,406)		-
පෙර වර්ෂය ගැලපීම්		-	-	-	-
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (හිඟය)	(446,530)				(446,530)
2019 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**(446,530)**	**2,718,626**	**3,142,594**	**8,759,378**	**14,174,068**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා	**(රු.)** **2019**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (භාවිතා කළ) මූල්‍ය ප්‍රවාහය	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/ (හිඟය)	(446,530)
ගැලපීම්	
මූල්‍ය නොවන සංචලන	
දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම	594,870
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම	438,776
පොළී ආදායම	(9,305)
ආදායම් ක්‍රමක්ෂය	(594,869)
මෙහෙයුම්වලින් අතිරික්තය / (හිඟය)	**(17,059)**
බඩු තොගවල (වැඩිවීම) / අඩුවීම	(117,133)
ජංගම වත්කම්වල (වැඩිවීම)/ අඩුවීම	-
ජංගම වගකීම්වල (වැඩිවීම) / අඩුවීම	1,703,660
පාරිතෝෂිකය සඳහා ගෙවීම	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**1,569,469**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතා කළ) මූල්‍ය ප්‍රවාහය	
-	
දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම	(2,916,056)
කාර්ය මණ්ඩලයට ණය ගෙවීම්	(400,000)
කාර්ය මණ්ඩලයෙන් ණය ආපසු අය කර ගැනීම්	60,000
අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොළී ආදායම	9,305
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතා කළ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහ)	**(3,246,751)**
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රකාශනය	
වසර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	13,100,000
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**13,100,000**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	11,422,717
වසර ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	-
වසර අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**11,422,717**

මුදල් හා මුදල් සමාන දෑ:

මුදල් හා බැංකු ශේෂ (සටහන 3)	**11,422,717**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය සාධනයේ අයවැය සමඟ තුලනාත්මක ප්‍රකාශනය

දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම	**සටහන**	**2019** තථ්‍ය **රු.**	**2019** අයවැය **රු.**
භාණ්ඩාගාරයන් ලැබුනු පුනරාවර්තන ප්‍රදාන		9,051,000	10,000,000
වි.වි.ප්‍ර.කොා.ස. ලැබුනු පුනරාවර්තන පුතිලාභ		2,000,000	-
වෙනත් ආදායම	**12**	21,317	-
ආදායම ක්‍රමක්ෂය	**13**	594,869	-
මුළු ආදායම		**11,667,186**	**10,000,000**
මෙහෙයුම් ආදායම			
පෞද්ගලික පඩිනඩි	**14-A**	6,283,317	5,605,000
ගමන් සහ යැපීම් දීමනාව	**14-B**	300	10,000
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	**14-C**	232,702	210,000
නඩත්තු වියදම්	**14-D**	37,780	30,000
කොන්ත්‍රාත් සේවා	**14-E**	3,733,387	2,630,000
වෙනත් පුවරාවර්තන වියදම්	**14-F**	1,231,360	1,515,000
ක්ෂය වියදම්	**14-G**	594,870	-
මුළු වියදම්		**12,113,716**	**10,000,000**
පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය)		**(446,530)**	**-**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

2019 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

සාමාන්‍ය තොරතුරු

1.1 නෛතික සහ ආයතනික ස්ථාපනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 ඒ වගන්තිය සමඟ කියවිය යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2017 අංක 05 දරන ආඥා පනතේ 18වැනි වගන්තිය මඟින් පිහිටුවන ලද අතර 2018 අංක 2031/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. විද්‍යායතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වන අතර 2019 පෙබරවාරි මස ආඥා පනතේ විස්තර කළ එහි කටයුතු ආරම්භ කරන ලදී. කාර්යාලය බොරැල්ල, කොටා පාර, ආයුර්වේද ශික්ෂණ රෝහලේ 5වැනි මහළේ තාවකාලිකව ස්ථාපනය කර ඇත.

2019 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහන ප්‍රකාශනය 2020 පෙබරවාරි මස 28වැනි දින කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

1.2 මූල්‍ය කාලපරිච්ඡේදය

ආයතනයේ මූල්‍ය කාලපරිවඡේදය 2019 ජනවාරි මස 01වැනි දින සිට 2019 දෙසැම්බර් මස 31වැනි දින දක්වා වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

(අ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව මඟින් අනුමත කරන පරිදි ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි උපදේශනය, පුහුණුව සහ පර්යේෂණ සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීම සහ එම සේවා සැපයීම.

(ආ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය සහ කොමිෂන් සභාවේ එකඟතාව ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම හෝ අදාළ විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ වෙනත් අධ්‍යයන විශිෂ්ටතා පිරිනැමීමට තීරණය කිරීම.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම හෝ අදාළ විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥතා අත්කර ගත් තැනැත්තන් තීරණය කිරීමේ කාර්ය සඳහා පශ්චාත් උපාධි පර්යේෂණ පැවැත්වීම සහ පර්යේෂණ සමත්ව සිටින සහ ආයතනයේ අදහස් විමසා, විශ්වවිද්‍යාලය මඟින් නියම කරන අනු-නීති අනුව වෙනත් කොන්දේසි සපුරා ඇති, ඒ අනුව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ වෙනත් අධ්‍යයන විශිෂ්ටතා ප්‍රදානය කිරීමට සුදුසුකම් සපුරාලන තැනැත්තන් පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම.

(ඈ) ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් විශ්වවිද්‍යාලය හෝ ආයතන සමඟ ගුරු, ශිෂ්‍ය සහ විද්වතුන් හුවමාරු කර ගැනීම හෝ වෙනත් ආකාරයකින් සහයෝගීතා ඇති කර ගැනීම.

1.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන කෙරී ගෙන යන වැඩ පදනම මත සකස් කර ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

1.5.1 අනුකූලතා ප්‍රකාශනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මඟින් නිකුත් කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය, සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී යොදා ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

1.5.2 ගණන් ගැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝග්‍ය අවස්ථාවල දී අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම් සම්බන්ධයෙන් යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

1.5.3 සන්සන්දනාත්මක තොරතුරු

මෙය ආයතනයේ පළමුවැනි වාර්තාකරණ කාලපරිච්ඡේදය වන බැවින් හෙළිදරව් කිරීම සඳහා තුලනාත්මක සංඛ්‍යා නොමැත.

1.5.4 වැදගත්භාවය සහ සමූහනය

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ කාර්යයන් ඇති අයිතම වැදගත් නොවන්නේ නම් මිස වෙනම ඉදිරිපත් කර ඇත.

1.5.5 හිලව් කිරීම

SLIPSAS මඟින් අවශ්‍ය කර හෝ අවසර දී ඇත්තේ නම් මිස වත්කම් හා වගකීම් සහ ආදායම හා වියදම හිලව් කිරීම සිදු කර නොමැත.

1.5.6 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයට පසු සිදුවීම්

වාර්තා කරන දිනයට පසුව එළැඹෙන සියලුම වැදගත් සිදුවීම් සලකා බලන ලදුව අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල නිසි ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

1.5.7 ක්‍රියාකාරි සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය

මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයේ ඉදිරිපත් කිරීමේ සහ ව්‍යවහාර මුදල් වර්ගය වන "ශ්‍රී ලංකා රුපියල්" (Rs.) වලින් සකස් කර ඉදිරිපත් කර ඇත.

1.5.8 වටැයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකට දක්වා ඇත්තේ නම් මිස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් ආසන්න රුපියලට වටයා ඇත.

1.5.9 වැදගත් ගිණුම්කරන ඇස්තමේන්තු සහ තීන්දු

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ වැදගත් තීන්දුවල කිසියම් වෙනස්කමක් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1 ජංගම වත්කම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් මූල්‍ය ප්‍රකාශනයේ දිනයෙන් වසරක් ඇතුළත ආපසු අය කර ගන්නා මූල්‍ය වත්කම් වේ.

2.1.1 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑවලට අතැති මුදල්, බැංකු ශේෂ සහ කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ.

2.1.2 බඩු වට්ටෝරු සහ තොග

බඩු වට්ටෝරු පිරිවැය අඩු සහ ශුද්ධ හඳුනාගැනීමේ වටිනාකමට දක්වා ඇත. සාමාන්‍යයෙන් පිරිවැය පළමුව එන පළමුව යන පදනමට තීරණය කරනු ලබන අතර බඩු ලේඛන අත්කර ගැනීමට දැරූ වියදම සහ ඒවා පවතින තත්ත්වයට හා ස්ථානයට ගෙන ඒමට දැරූ වියදම ඇතුළත් වේ.

ලිපි ද්‍රව්‍ය හා වෙනත් පාරිභෝගික අයිතම ආයතනයේ බඩු ලේඛනවලට ඇතුළත් වේ.

2.2 ජංගම නොවන වත්කම්

2.2.1 දේපළ, පිරියත හා උපකරණ

කාර්යාල හා ශික්ෂණ උපකරණ, ගෘහභාණ්ඩ හා තිරවුරු, පරිගණක හා පරිගණක මෙවලම් සහ වෙනත් වත්කම් රජයේ ප්‍රදානවලින් අත්කර ගත් අයිතමවලට ඇතුළත් වේ.

කොළඹ විශ්වවිද්‍යාලය 2019 වසරේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබූ මූලික ප්‍රදානවලින් ආයතනය සඳහා රු. 2,264,892.50 ක් වටිනා අයිතම මිල දී ගෙන ඇත. මෙම වත්කම් 2018 වසරේ දී කොළඹ විශ්වවිද්‍යාලය මඟින් ඔවුන්ගේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ප්‍රාග්ධනය කර ඇත. තව ද කොළඹ විශ්වවිද්‍යාලය 2018 වසරේ දී සහ 2019 ජුනි මස 30වැනි දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා සමුච්චිත ක්ෂයවීම් ලෙස පිළිවෙලින් රු. 149,425.53ක් සහ රු. 112,313.85ක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව, 2019.07.01 වැනි දින වන විට ආයතනය මඟින් රු. 2,003,153.12ක වටිනාකම ඇති වත්කම් ඒවායේ ශුද්ධ ලිඛිත වටිනාකම පදනම්ව හඳුනා ගෙන, ප්‍රාග්ධනය කර ඇති අතර අදාළ ප්‍රදානය වත්කම්වල ඉතිරි ප්‍රයෝජනවත් ජීවිත කාලය අතරතුර ක්‍රමක්ෂය කර ඇත.

අ) හඳුනා ගැනීමේ සහ ගණනය කිරීමේ පදනම

දේපළ, පිරියත හා උපකරණවල අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැක්කේ නම් හඳුනා ගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂයවීම් ලෙස වාර්තා කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය ඒවා මිල දී ගැනීමේ පිරිවැය සහ ඒවා සම්බන්ධ ආනුශංගික විදයම්වල එකතුව වේ.

සියලුම දේපළ, පිරියත හා උපකරණ ආරම්භයේ දී පිරිවැයට දක්වන අතර පසුව පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂය සහ අගය අඩු වීම අඩුකර වාර්තා කෙරේ . අළුත්වැඩියා කිරීමේ සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද ආකාරයට විස්තීරණ ආදායම ප්‍රකාශනයේ දක්වා ඇත.

ආ) මූලික හඳුනා ගැනීම

වත්කම් ස්වභාවික පදනම මත මුදල් බවට හරවා ඇත. වත්කම් අස්පර්ශනීය, වසරකට වැඩි ජීවිත කාලයක් තිබීම සහ සැලකිය යුතු පිරිවැයක් තිබීම මත මුදල් බවට හරවා ඇත. වත්කමේ ජීවිත කාලය වසර 5 සිට 20 දක්වා එහි කාණ්ඩය අනුව රඳා පවතී.

ඇ) පවතින ස්ථාවර වත්කම්වල පසුකාලීන පිරිවැය

ස්පර්ශනීය, ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් දැරූ වියදම පහත දැක්වෙන නිර්ණායක සපුරාලන්නේ නම් මිස ඒවා දැරූ කාලපරිවර්ජේදය තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇති අතර අදාළ පදනම මත ප්‍රාග්ධනය කොට, ක්ෂය කරනු ලැබේ.

- ස්ථාවර වත්කම්වල වෙළඳපොළ වටිනාකම පසුව වැඩි කර ඇත.
- වත්කම් ධාරිතාව වැඩි කර ඇත.
- නිමැවුමේ ගුණාත්මකභායේ තිරසර වැඩිදියුණු කිරීම හෝ මෙහෙයුම් පිරිවැයේ අඩුවීම.
- අළුත්වැඩියා කිරීම සහ නඩත්තුව මඟින් තහවුරු කර ඇති කාලසීමාව ඉක්මවා වත්කමේ ජීවිත කාලය සැලකිය යුතු ලෙස දීර්ඝ කිරීම.

ඇ) ක්ෂයවීම

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රයෝජනය සඳහා පත් කළ දිනයේ සිට ඒවායේ ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට සරල රේඛීය පදනම මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත. ඉඩම් ක්ෂය කරනු නොලැබේ. ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලපරිච්ඡේදයන් පහත දැකවෙන පරිදි වේ:

විස්තරය	ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය
කාර්යාල හා ශික්ෂණ උපකරණ	වසර 10
පරිගණක හා පරිගණක මෙවලම්	වසර 5
ගෘහභාණ්ඩ හා තිරවුරු	වසර 10

ක්ෂයවීම් භාවිතා කළ කාලපරිච්ඡේදය මත පදනම්ව, මිල දී ගත් දින සිට අපහරණ දිනය දක්වා දක්වා ඇත. කොළඹ විශ්වවිද්‍යාලයෙන් මාරු කළ වත්කම් එම විශ්වවිද්‍යාලය මඟින් ජුනි 30වැනි දින දක්වා ක්ෂය කර ඇති බැවින් 2019.07.01 දින සිට ක්ෂය කරනු ලැබේ.

2.3 වගකීම් සහ වෙන් කිරීම්

2.3.1 ජංගම වගකීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් නම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයේ සිට වසරක කාලයක් තුළ ගෙවීමට ඇති වගකීම් වේ. දන්නා සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ගණනය කර ඇත.

2.3.2 විශ්‍රාම ප්‍රතිලාභ සඳහා විධිවිධාන

සේවක ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සේවකයෙක් විශ්‍රාම යන විට ලැබෙන ප්‍රතිලාභ අගය ඇස්තමේන්තු කරනු ලබයි. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ විශ්වවිද්‍යාලය මඟින් ප්‍රතිලාභ සැලැසුම භාවිතා කරනු ලැබේ.

එය සේවකයාගේ වයස, සේවා කාලය සහ වන්දි යන සාධක මත තීරණය වේ. මෙම වගකීම සපුරාලීම සඳහා අභ්‍යන්තර කළමනාකරණ ඇගයීම මත පදනම්ව ගණනය කළ අගය වාර්තා කරන දිනයට විධිවිධානයක් ක්‍රියාත්මක කරන ලදී. කාලපරිච්ඡේදය ආරම්භයේ දී ඉදිරියට ගෙන ආ විධිවිධාන සහ කාලපරිච්ඡේදය අවසානයේ දී ඉදිරියට ගෙන ආ විධිවිධින අතර වෙනස ලාභය සහ අලාභය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

පාරිතෝෂික වගකීම සඳහා බාහිරින් අරමුදල් සැපයීම හෝ ජීවගණක තක්සේරුවක් සිදු නොවේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම ආයතනයක් විසින් වෙනස් ආයතනයක් වෙත ස්ථාවර දායකත්වයක් ගෙවනු ලබන පසු-සේවානියුක්ති සැලසුමක් වන අතර වැඩිපුර අගයක් ගෙවීම සඳහා කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නොමැත. නිශ්චිත දායකත්ව සැලසුම්වලට දායකත්වය ගෙවීම සඳහා වූ බැඳීම් ඒවා ගෙවිය යුතු අවස්ථාවල දී විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස දක්වා ඇත.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) සහ විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල

ශ්‍රී ලංකාවේ ඇති අදාළ ව්‍යවස්ථා, නීති සහ විශ්වවිද්‍යාල පනත අනුව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා ආයතනය විසින් 15%ක දායකත්වයක් සහ සේවකයින් විසින් ඔවුන්ගේ දළ වැටුපෙන් 7% සහ 10% ලෙස දායකත්වය දක්වයි. එමෙන්ම විශ්වවිද්‍යාලය විශ්‍රාම යන සේවකයින් වෙනුවෙන් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලය 8%ක දායකත්වයක් ද දක්වයි.

සේවක භාරකාර අරමුදල (ETF)

විශ්වවිද්‍යාලය සෑම සේවකයෙක්ගේම දළ වැටුපෙන් 3%ක් සේවක භාරකාර අරමුදලට දායකත්වය දක්වයි.

2.3.3 අසම්භාව්‍ය බැරකම්

නඩු කටයුතුවලින් ඇති වූ වගකීම් සම්බන්ධයෙන් කිසිදු විධිවිධානයක් ගිණුම්ගත කර නොමැත. 2019 දෙසැම්බර් මස 31වැනි දිනට ඇති ඇස්තමේන්තුගත සියලුම වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

2.4 ස්කන්ධ ප්‍රාග්ධනය

2.4.1 ප්‍රාග්ධන ප්‍රදාන

රජයේ ප්‍රදාන ලැබීමේ සහ සියලුම කොන්දේසිවලටඅනුකූලවීමේ යුක්තිසහගත සහතිකවීම මත රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා වූ රජයේ ප්‍රදාන සහ වෙනත් සංවිධානවලින් ලැබෙන දායකත්වය පළමු වැනි අවස්ථාවේ දී ලැබූ ප්‍රදාන ලෙස සලකනු ලැබේ. වත්කම් මිල දී ගැනීම සඳහා උපයෝජනය කර ගැනීම මත ඒවා වැය නොකළ ප්‍රාග්ධන ගිණුමට ඇතුළත් කරන අතර එසේ නැතහොත් වියදම් කළ වත්කම් මිල දී ගැනීම සඳහා ආදායමට හෝ වියදමට ඇතුළත් කරනු ලැබේ.

2.4.2 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මුදල් පදනම මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇත.

ප්‍රදාන සඳහා ගිණුම්ගත කිරීම

දැරූ වියදම් සඳහා විශ්වවිද්‍යාලයට ගෙවනු ලබන ප්‍රදාන වියදම් හඳුනාගත් කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා විශ්වවිද්‍යාලයට ගෙවනු ලබන ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට ක්‍රමානුකූල පදනමක් මත ආදායම ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුව විශ්වවිද්‍යාල 20ක් විසින් ප්‍රාග්ධන ප්‍රදාන හඳුනා ගැනීමේ දී ආදායම් ප්‍රවේශ ගිණුම්කරණ මූලධර්මය යොදා ගනී.

2019 වසරේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබූ මූලික ප්‍රාග්ධන ප්‍රදානය රු. 7,000,000.00 ක් වන අතර 2019 වසරේ දී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රදාන රු. 6,100,000.00ක් විය. මෙම ප්‍රදාන දෙක 2019 වසරේ දී ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන දෙකක් ලෙස වෙනම දක්වා ඇති අතර ඒ අනුව ක්‍රමක්ෂය කර ඇත. මෙයට අමතරව, 2019 වසරේ දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් මාරු කළ වත්කම් පදනම්ව MOHE වලින් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. 2,115,466.97 ක් හඳුනා ගෙන ඇත.

2.5 විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය

2.5.1 ආදායම හඳුනාගැනීම

ගෙවීම් සිදු කළ දිනය නොසලකා ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ හැකියාව සහ ආදායම විශ්වාසදායක ලෙස මැනීමේ හැකියාව අනුව ආදායම හඳුනා ගනු ලැබේ. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැකවෙන හඳුනාගැනීම් නිර්ණායක ද සම්පූර්ණ කළ යුතුය.

01. පොලී ආදායම

පොලි ආදායම ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ආදායම හෝ වියදම මත උපචය වන ආකාරයට හඳුනා ගනු ලැබේ.

02. වෙනත් ආදායම

ඉහත කණ්ඩ යටතේ විශේෂයෙන් දක්වා නොමැති වෙනත් කිසියම් ආදායමක් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

2.5.2 වියදම් හඳුනා ගැනීම

ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සිදු කිරීම සම්බන්ධ වියදම් උපචිත පදනම මත හඳුනා ගන්නා අතර ඒවා වියදම් කළ කාලපරිච්ඡේදය අතරතුර විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර ගනු ලැබේ.

2.6 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 අනුව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් සකස් කරනු ලබන අතර මෙහෙයුම් කටයුතුවල දළ මූල්‍ය ලැබීම් සහ දළ මූල්‍ය ගෙවීම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන කටයුතු හඳුනා ගෙන ඇත.

2.7 වගකීම් සහ අවිනිශ්චිතතාවන්

සිතිය හැකි සියලුම අවදානම් සියලුම වගකීම්වල අගය තීරණය කිරීමේ දී ගිණුම්ගත කර ඇත. අවිනිශ්චිත වගකීම් යනු අනිවිශ්චිත අනාගත සිදුවීම්වලින් සහතික කළ හැකි වන සිදුවිය හැකි බැඳීම් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදු කිරීමේ හැකියාවක් නොමැති සහ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි වර්තමාන බැඳීම් වේ. අවිනිශ්චිත වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොමැති නමුත් ඒවා දුරස්ථ වන්නේ නම් මිස හෙළිදරව් කරනු ලැබේ.

2.8 වාර්තා කරන දිනයට පසු සිදුවීම්

වාර්තා කරන කාලපරිච්ඡේදයට පසුව සිදු වන සිදුවීම්වල වැදගත්කම සලකා බලා ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවලට සුදුසු ගැලපීම් සිදු කර ඇත.

සටහන 03 මුදල් හා මුදල් හා සමාන දෑ	**2019** රු.
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084061028 - පුනරාවර්තන	1,270,818
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084060859 - ප්‍රාග්ධන	142,594
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0085283375 - අරමුදල් කළමනාකරණ ගිණුම	10,009,305
	11,422,717

සටහන 04 කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	ආපසු අය කර ගැනීම්	ආපසු අය කර ගැනීම්	**2019** රු
ආපදා ණය	50,000	162,500	212,500
පරිගණක ණය	6,000	19,500	25,500
ප්‍රවාහන ණය	24,000	78,000	102,000
	80,000	**260,000**	**340,000**

සටහන 05 බඩු ලේඛන /තොග	**2019** රු
තොග	117,133
	117,133

සටහන 06 **2019**

දේපළ, පිරියත හා උපකරණ **රු.**

විස්තරය	**2019.01.01** දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්/ ගැලපීම්	**2019.12.31** දිනට ශේෂය
කාර්යාල හා ශික්ෂණ උපකරණ	-	1,970,238	-	1,970,238
පරිගණක හා පරිගණක මෙවලම්	-	1,372,717	-	1,372,717
ගෘහභාණ්ඩ හා තිරවුරු	-	2,991,253	-	117,133
එකතුව	**-**	**6,334,208**	**-**	**6,334,208**

ක්ෂයවීම් සඳහා වෙන්කිරීම්

විස්තරය	%	**2019.01.01** දිනට ශේෂය	වසරසඳහා ගාස්තුව	ඉවත් කිරීම්/ ගැලපීම්	**2019.12.31** දිනට ශේෂය
කාර්යාල හා ශික්ෂණ සංවර්ධනය සඳහා වෙන් කිරීම	10		146,427		146,427
දෙපාර්තමේන්තු පරිගණක හා මෙවලම් සඳහාවෙන්කිරීම	20		278,424		278,424
දෙපාර්තමේන්තු ගෘහභාණ්ඩ හා තිරවුරු සඳහාවෙන්කිරීමPro. For Dep. Furniture & Fittings	10		170,019		170,019
එකතුව		**-**	**594,870**	**-**	**594,870**

විස්තරය	**2019.01.01** දිනට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්/	**2019.12.31** දිනට ශේෂය
කාර්යාල හා ශික්ෂණ උපකරණ	-	1,823,810	-	1,823,810
පරිගණක හා පරිගණක මෙවලම්	-	1,094,294	-	1,094,294
ගෘහභාණ්ඩ හා තිරවුරු	-	2,821,234	-	2,821,234
එකතුව	**-**	**5,739,339**	**-**	**5,739,338**

සටහන **07**	**2019**
සමුච්චිත වියදම්	**රු.**
සමුච්චිත වියදම්-පුනරාවර්තන	1,689,383
සමුච්චිත වියදම්-ප්‍රාග්ධන	1,302,685
එකතුව	**2,992,068**

සටහන **08**	**2019**
ගෙවිය යුතු	**රු.**
ගෙවිය යුතු මුද්දර ගාස්තු	900
PAYE බදු ගෙවීම	13,377
එකතුව	**14,277**

සටහන **09**	**2019**
විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ගෙවීම	**රු.**
ජනවාරි -1 දිනට ශේෂය	-
වර්ෂය සඳහා ගාස්තුව	438,776
	438,776
වර්ෂය තුළ ගෙවීම්	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**438,776**

සටහන **10**	**2019**
ප්‍රාග්ධන ප්‍රදාන	**රු.**
ගෙවූ ප්‍රාග්ධන ප්‍රදාන	2,718,626
නොගෙවූ ප්‍රාග්ධන ප්‍රදාන	3,142,594
MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන	8,759,378
	14,620,597

සටහන**11**	**2019**
සමුච්චිත අතිරික්තය සහ හිඟය	**රු.**
ජනවාරි -1 දිනට ශේෂය	-
ගැලපීම් (පෙර වර්ෂය)	-
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය /(හිඟය) For the Period	(446,530)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**(446,530)**

සටහන **12**	**2019**
වෙනත් ආදායම්	**රු.**
ණය හා අත්තිකාරම්වලින් පොළිය	12,012
අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොළිය	9,305
එකතුව	**21,317**

සටහන **13**	**2019**
ආදායම් ක්‍රමක්ෂය	**රු.**
-	
ආදායම් ක්‍රමක්ෂය - රජයේ ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්)	238,780
ආදායම් ක්‍රමක්ෂය - MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්)	356,089
එකතුව	**594,869**

මුළු විදයම්

සටහන 14 -අ පෞද්ගලික පාරිශ්‍රම	2019 රු.
<u>අධ්‍යයන</u>	
වැටුප් හා වේතන	1,918,967
එකතුව	**1,918,967**
<u>අධ්‍යයන-නොවන</u>	
වැටුප් හා වේතන	3,011,116
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	155,237
විශ්‍රාම වැටුප්	73,053
සේවක භාර අරමුදල	27,395
මාසික වන්දි දීමනාව	260,515
නිවාඩු ගෙවීම්	6,127
පාරිතෝෂිකය	438,776
පර්යේෂණ දීමනා	202,623
ජීවන වියදම් දීමනාව	73,723
අතිරේක දීමනාව 20%	115,785
එකතුව	**4,364,350**
එකතුව	**6,283,317**

සටහන 14 -ආ ගමන් වියදම් හා යැපීම් දීමනාව	2019 රු.
දේශීය	300
එකතුව	**300**

සටහන 14 -ඇ සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	2019 රු.
ලිපි ලේඛන හා කාර්යාල අවශ්‍යතා	155,814
ඉන්ධන හා ලිහිසි තෙල්	60,363
වෙනසත් සැපයුම්	16,525
එකතුව	**232,702**

සටහන 14 - ඈ නඩත්තු වියදම්	2019 රු.
ගොඩනැගිලි හා ව්‍යුහය	37,780
එකතුව	**37,780**

සටහන **14 - ඉ**	**2019**
කොන්ත්‍රාත් සේවා	**රු.**
ජනසන්නිවේදනය	93,582
තැපැල් ගාස්තු	4,640
විදුලිබලය	450,000
ආරක්ෂක සේවාව	414,972
ජලය	200,000
පිරිසිදු කිරීමේ සේවාව	595,148
කුළී හා කුලියට ගැනීමේ ගාස්තු	1,740,629
මුද්‍රණය හා දැන්වීම් ප්‍රචාරණය	234,416
එකතුව	**3,733,387**

සටහන **14 - ඊ**	**2019**
වෙනත් පුනරාවර්තන වියදම්	**රු.**
විශේෂ සේවා - කවුන්සිලය හා කමිටු	878,390
විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් සේවා	340,000
කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව	5,870
බැංකු ගාස්තු	7,100
එකතුව	**1,231,360**

සටහන **14 -උ**	**2019**
ක්ෂය වියදම්	**රු.**
කාර්යාල හා ශික්ෂණ උපකරණ සංවර්ධනය	146,427
ගෘහභාණ්ඩ හා තිරවුරු සංවර්ධනය	170,019
පරිගණක හා පරිගණක මෙවලම් සංවර්ධනය	278,424
එකතුව	**594,870**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

2019 දෙසැම්බර් මස 31 දිනට පිරික්සුම් ශේෂය

ක්ෂේත්‍රය හා ගිණුම් අංකය		හර	බැර
30010 - පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම			438,775.65
30100 - උපචිත විදයම් - ප්‍රාග්ධනය			1,302,685.22
30110 - උපචිත වියදම් - පුනරාවර්තන			1,689,382.80
30120 - ගෙවිය යුතු මුද්දර ගාස්තු			900.00
30140 - ගෙවිය යුතු PAYE			13,377.00
30160 - ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් කාර්යාල හා ශික්ෂණ උපකරණ			146,427.17
30170 - ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් පරිගණක හා මෙවලම්			278,423.51
30180 - ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් ගෘහභාණ්ඩ හා තිරවුරු			170,018.86
20050 - ගෘහභාණ්ඩ හා තිරවුරු		2,991,253.21	
20060 - කාර්යාල හා ශික්ෂණ උපකරණ		1,970,237.54	
20070 - පරිගණක හා පරිගණක මෙවලම්		1,372,717.44	
20200 - බඩු ලේඛන		117,132.78	
20210 - ආපදා ණය		212,499.97	
20220 - ප්‍රවාහන ණය		102,000.00	
20230 - පරිගණක ණය		25,500.00	
20240 - අත්තිකාරම්		-	
20245 -සුළු මුදල් අග්‍රිමය		-	
20250 - BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084061028 - පුනරාවර්තන		1,270,818.33	
20260 - BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084060859 -ප්‍රාග්ධනය		142,594.00	
20270 - BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0085283375 - අරමුදල් කළමනාකරණ ගිණුම		10,009,304.79	
10010 - වැටුප් හා වේතන		1,918,967.24	
10510 - වැටුප් හා වේතන		3,011,116.32	
10520 - විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල		155,237.41	
10530 - විශ්‍රාම වැටුප		73,052.93	
10540 - සේවක භාරකාර අරමුදල		27,394.82	
10570 - නිවාඩු ගෙවීම්		6,127.35	
10590 - ජීවන වියදම් දීමනාව		73,722.59	
10620 - පාරිතෝෂිකය		438,775.65	
10680 - පර්යේෂණ දීමනාව		202,623.11	
10650 - 20% අතිරේක දීමනාව		115,784.64	
10690 -45 %ක මාසික වන්දි දීමනාව		260,515.43	
11010 - ගෘහස්ථ		300.00	
12010 - ලිපි ලේඛන හා කාර්යාල අවශ්‍යතා		155,813.94	
12020 - ඉන්ධන හා ලිහිසි තෙල්		60,363.07	
12070 - වෙනත්		16,525.00	
13030 - ගොඩනැගිලි හා ව්‍යුහ		37,780.00	
14020 - ජනසන්නිවේදනය		93,581.67	
14030 - තැපැල් ගාස්තු		4,640.00	
14040 - විදුලිය		450,000.00	
14050 - ආරක්ෂක සේවා		414,972.16	

14060 - ජලය		200,000.00	
14070 - පිරිසිදු කිරීමේ සේවා		595,148.00	
14080 - කුළී හා කුලී ගාස්තු		1,740,629.03	
14100 - මුද්‍රණය, දැන්වීම් ප්‍රචාරණය ආදිය		234,416.00	
15020 - විශේෂ සේවා - කවුන්සිලය හා කමිටු		878,390.00	
15030 - විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් ගාස්තු		340,000.00	
15060 - කාර්ය මණ්ඩල සංවර්ධනය (පුහුණුව)		5,870.00	
15170 - බැංකු ගාස්තු		7,100.00	
15240 - ක්ෂයවීම් - කාර්යාලය හා ශික්ෂණ උපකරණ		146,427.17	
15250 - ක්ෂයවීම් - පරිගණක හා පරිගණක මෙවලම්		278,423.51	
15260 - ක්ෂයවීම් - ගෘහභාණ්ඩ හා තිරවුරු		170,018.86	
40100 - භාණ්ඩාගාරයෙන් ලැබූ පුනරාවර්තන ප්‍රදාන			9,051,000.00
40110 - වි.ප්‍ර.කොා.ස. ලැබූ පුනරාවර්තන ප්‍රදාන			2,000,000.00
40140 - වියදම් කළ භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රනරාවර්තන ප්‍රදාන			2,718,625.71
40150 - භාණ්ඩාගාරයෙන් ලැබූ වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන			3,142,594.00
40160 - MOHEවලින් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන			8,759,377.72
40170 - ණය හා අත්තිකාරම්වලින් ලැබූ පොළී ආදායම			12,011.99
40180 - අරමුදල් කළමනාකරණ ගිනුමෙන් පොලී ආදායම			9,304.79
40190 -ක්‍රමක්ෂ ආදායම - ස්ථාවර වත්කම්			594,869.54
		30,327,773.96	30,327,773.96

6. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. | පී.වී.යූ/බී/ඕඩිඅයිඇයිඑම/ඇන්ජ්/2019/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date | 2020 සැප්තැම්බර් 01 දින

08 SEP 2020

අධ්‍යක්ෂ

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව යමින සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා යාථාර්ත්‍ය තත්ත්වයක් පිළිබිඳු කරන බව විා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන පාර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

2

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා යැලැසීම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන හෙයින්, දුස්සන්ධානය, වියාජ ලේඛණ සැකසීම්, වේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් හෙළිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා යැලැසීම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම්.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිශ්චිත යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවුකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මෙතෙක් වූවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම්.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන යොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරා ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් ඇති බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලන මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලන මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත්කර නොතිබුණි.

4

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 756 දරන මුදල් රෙගුලාසිය	මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය රු.6,334,208 ක් වූ වත්කම් සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.
(ඇ) 2009 ජුනි 09 දිනැති අංක ඩී.එම්.ඒ/2009(01) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය	විගණන හා කළමනාකරණ රැස්වීම් 4 ක් පැවැත්විය යුතු වුවත් ආයතනය සඳහා විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂය තුළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද රුපියල් 7,000,000 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් සහ මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා ලද රු.6,100,000 ක මුදලින් වැය නොකළ රු.3,000,000 ක් වූ එකතුව රුපියල් 10,000,000 ක් අරමුදල් කළමනාකරණ ඉතිරිකිරීම් ගිණුමක ආයෝජනය කර තිබුණි.

(ආ) 2017 අංක 05 දරන නියමාවලිය යටතේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2017 දෙසැම්බර් 06 දින සිට බලපැවැත්වෙන පරිදි ස්ථාපනය කර තිබුණ ද 2020 ජූලි 15 දින දක්වාත් අධ්‍යයන කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතිය ඇතිව සියළුම පශ්චාත් උපාධි (MD) විෂය මාලාවන් සඳහා පත්කර තිබුණු අධ්‍යයන මණ්ඩල (Board Of study) 03 හි (ආයුර්වේද, යුනානි සහ සිද්ධ) විෂය මණ්ඩල 11 ට අදාළ විෂය නිර්දේශ සඳහා කළමනාකරණ මණ්ඩලයේ, කොළඹ විශ්වවිද්‍යාලයේ

5

සනාතන සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වුවද 2020 අගෝස්තු 21 වන විට එයින් විෂය මණ්ඩල 2 ක් සඳහා පමණක් සම්පූර්ණ අනුමැතිය ලබාගෙන තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2017 දෙසැම්බර් 06 දින සිට ස්ථාපිත කිරීමෙන් පසු දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් 2016/2019 පශ්චාත් උපාධි MD(AYU) පාඨමාලාව සඳහා බඳවාගෙන වසර 2 ක න්‍යායාත්මක පුහුණුව පවසන් කර තිබුණු සිසුන් 31 දෙනෙකු දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අන්තර්ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඉ) 2018 සැප්තැම්බර් 26 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර පැවති කාර්ය මණ්ඩල තනතුරු 7 කට අදාළව නිළධාරීන් 16 ක් වූ අතර ඉන් 2020 ජූනි 23 දින වන විට නිළධාරීන් 14 දෙනෙකු පුරප්පාඩු වී පැවතුණි. එසේම අනුමත කාර්යය මණ්ඩලය තුළ ඇතුළත් අධ්‍යක්ෂ තනතුර, කළමනාකරණ සහකාර තනතුරු 3 ක් සහ කාර්යාල කාර්ය සහායක තනතුරු 1 ක් සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් පදනමින් කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි.

(ඊ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී තිබුණද ආයතනයට අදාළ කර ගත හැකි තිරසර සංවර්ධන, ඉලක්ක හා අරමුණු ද එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

6

7. විගණකාධිපති වාර්තාවට පිළිතුර

මගේ අංකය :- PGIIM/Audit/2019/02

ඔබේ අංකය : ඊඩියු /බී /පිජිඅයිඅයිඑම් /එෆ්ඒ /2019

2021 පෙබරවාරි 24

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල

මහත්මයාණෙනි ,

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ඔබගේ ඉහත සමාංකය හා 2020 අගෝස්තු 11 දින දරණ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මුල්‍ය ප්‍රකාශන පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම පහත ඉදිරිපත් කෙරේ

2.1 <u>නීති රීති . රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

නීති රෙගුලාසිවලට යොමුව	විස්තරය
(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	2019 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව සකස් කර අවසන් අතර පරිවර්තනය සඳහා යොමුකර ඇත.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 756 දරන මුදල් රෙගුලාසිය	2019 වසරේ භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට නොහැකි වුව ද 2020 වසරේ භාණ්ඩ සමීක්ෂණය මේ වන විටත් සිදු කර අදාළ වාර්තාව ජාතික විගණන කාර්යාලය වෙත ලබා දී ඇත.
(ඇ) 2009 ජුනි 09 දිනැති අංක ඩී.එම්.ඒ/**2009(01)** දරන කළමානාකරණ විගණන දෙපාර්තුමෙන්තු චක්‍රලේඛය	2019 හා 2020 වර්ෂවල විගණන කමිටු ස්ථාපනය කර නොතිබූ අතර 2021.01.29 වන දින සිට නියමිත පරිදි විගණන කමිටු රැස්වීම් පැවැත්වේ.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) මෙම විගණන විමර්ශනය 2020 සැප්තැම්බර් මස පැවති මුදල් කමිටු නිර්දේශයට සහ ඉන්පසු පැවති කළමනාකරණ කමිටු අනුමැතියට යොමුකරන ලදී. එම නිර්දේශයන් සහ අනුමැතීන් පරිදි ආයතනය සඳහා වූ මෝටර් රථය මිලදී ගන්න තෙක් ඒ සඳහා වෙන්කල මිලියන 7 ක මුදල අරමුදල් කළමනාකරණ ගිණුමෙහි තවදුරටත් පවත්වාගෙන යාමට නිර්දේශ කරණ ලදී. තවද, මෝටර් රථය මිලදී ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කරන ලෙසද නිලධාරීන්ට දැනුම් දෙන ලදී. අරමුදල් කළමනාකරණ ගිණුමෙහි තැම්පත් කරන ලද ඉතිරි මුදලින් (එනම් 2019 අග වන විට ප්‍රාග්ධන ගිණුමෙහි වූ ඉතිරි මුදල) කොටසක් දැනටත් ප්‍රාග්ධන ගෙවීම් කර ඇති අතර ඉතිරිය එම ගිණුමෙහිම තවදුරටත් පවත්වාගෙන යාමට සහ අදාල චෙක්පත් එමගින් නිෂ්කාශනය කිරීමට තීරණය කරන ලදී.
(ආ) **2018** ජනවාරි මස සිට ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නියමිතව තිබුණද ආයතනය සක්‍රීයව ක්‍රියාත්මක වී ඇත්තේ **2019** පෙබරවාරි මාසයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආයතනයේ අධ්‍යක්ෂ, සහ **2019** මාර්තු මාසයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි පත් කිරීමෙන් අනතුරුවය. කළමනාකරණ මණ්ඩලයේ පළමු රැස්වීම **2019** පෙබරවාරි **26** දින පැවැත්වීම, අධ්‍යයන මණ්ඩල පත් කිරීම, බැංකු ගිණුම් ආරම්භ කිරීම සහ ව්‍යාපෘතියේ සඳහන් අධ්‍යයන පරිපාලන සහ මූල්‍ය කටයුතු **2019** මාර්තු මස සිට ආරම්භ කිරීම, විෂය නිර්දේශ සකස් කිරීම,විෂය නිර්දේශ අනුමැතීන් සඳහා යොමු කිරීම ආදී කටයුතු සිදු කර **2020** අප්‍රේල් මස **30** වන දින සිට පහත දැක්වෙන පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු සුදානම් කර තිබුණ ද රට තුළ පැවති කොවිඩ් 19 තත්වය හමුවේ සියලුම විශ්වවිද්‍යාල මාස **02** ක පමණ කාලයක් වසා දමා තැබීම සහ නැවත 2020 මැයි **11** වන දින සිට විශ්වවිද්‍යාල ආරම්භ කිරීමේදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි පැරණි අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය අවසන් වී තිබීමත්, නැවත **2020** ජුනි මස **23** නව වැඩබලන අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමත් හේතුවෙන් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද විය. මේ වන විට **2020** අගෝස්තු මස **17** වන දින සිට ආයුර්වේද පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කර ඇත.

(ඇ) මේ වන විට ආරම්භ කර ඇති ආයුර්වේද පාඨමාලා 05 සඳහා සහ තවත් එක් පාඨමාලාවක් සඳහා (යුනානි) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. ඊට අමතරව තවත් පාඨමාලා 2 ක් සඳහා අනුමැතීන් ලබා ගැනීම පිණිස අදාල අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර පාඨමාලා 4කට අදාල අයදුම්පත් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සහා සහ පාලක සභා අනුමැතීන් ලැබී ඇත. එම අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට නියමිතය.
(ඈ) සම්මුඛ පරීක්ෂණවලදී තෝරා ගත් සිසුන් **31** කට පාඨමාලා ආරම්භ කරන බවත්, අදාළ මුදල් ගෙවා ලියාපදිංචි වන ලෙසත් ලිපි සහ විද්‍යුත් ලිපි මඟින් දැනුම් දුන් අතර ඒ අනුව සිසුන් **24** දෙනෙකු පාඨමාලාව සඳහා ලියාපදිංචි වී ඇත. මේ අතරින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සිසුන් **5** දෙනෙකු සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ඔවුන් සිදු කළ අධ්‍යයන කටයුතු සලකා මාස **6** සහ අවුරුද්ද වශයෙන් අධ්‍යයන කටයුතුවලින් නිදහස් කිරීමක් සිදු කර ඇත. ඒ අනුව ශිෂ්‍යයන් 19 දෙනෙකු **2020** අගෝස්තු මස **17** වන දින සිට පාඨමාලා හැදෑරීම ආරම්භ කළ අතර මේ වන විට ශිෂ්‍යයන් **21** දෙනෙකු අධ්‍යයන පාඨමාලා **5** ක් යටතේ **2021.02.17** වන දින සිට අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතී.

(ඉ) මේ වන විට කාර්ය මණ්ඩල පුරප්පාඩු 9ක් පමණක් පවතින අතර සහකාර පුස්තකාලයාධිපති, තාක්ෂණ නිලධාරී හා කලමණාකරණ සහකාර(පොත් තබන්නා) යන තනතුරු පිරවීමට කටයුතු ආරම්භ කර ඇත.
රජයෙන් ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රාථමික ශ්‍රේණිවල පුරප්පාඩු රජයේ ශ්‍රම බලකාය යටතේ පුරවන බව දන්වා ඇති බැවින් ප්‍රාථමික ශ්‍රේණි සඳහා වන තනතුරු 05 පිරවීම සිදු කළ නොහැකි විය.
ස්ථීර පුරප්පාඩු පිරවීමත් සමග කොන්ත්‍රාත් පදනම මත සිටි නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම නැවැත්වීමට කටයුතු කර ඇත.

(ඊ) ආයතනයේ සංයුක්ත සැලැස්ම සකස් කිරීමේදී මෙම දර්ශකයන් හඳුනා ගැනීමට කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

8. විගණන කමිටුවේ නිරීක්ෂණය

විගණන කමිටු වාර්තාව

විගණන කමිටුවේ සංයුතිය

කළමණාකාර මණ්ඩලයට වගකිව යුතු උප කමිටුවක් ලෙස ස්ථාපනය කර ඇති දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විගණන කමිටුව විධායක නොවන කළමණාකරන මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. වසරේ දී පහත සඳහන් සාමාජිකයන් විගණන කමිටු කාර්යන්හි නියුක්ත වුහ.

සාමාජික	2021 වසරේ දී කමිටුවට සහභාගී වීම (සහභාගී වීම √ / සහභාගී නොවීම x)
1. ටී . එන් . ඔසන් මහතා - සභාපති	√
2. ටී . ධර්මරාජා මහතා - කමිටු සාමාජික	√
3. මහින්ද මඩිහගේවා මහතා - කමිටු සාමාජික	x

ඉහත සඳහන් සාමාජිකයින්ට අමතරව මෙම ආයතනයේ බාහිර විගණනය භාර ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී අයි.ඩී.අයි ප්‍රියදර්ශනි මහත්මිය 2021.01.29 වන දින පැවති විගණන කමිටුවට නිරීක්ෂණ මට්ටමින් සහභාගී විය.

රැස්වීම් පැවැත්වීම

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩි ./31 අනුව වසරකට අවම වශයෙන් සිව් වතාවක් මෙම කමිටුව රැස්විය යුතුය .ආයතනයේ පළමු විගණන කමිටු රැස්වීම 2021.01.29 වන දින පවත්වන ලදී . එහිදී අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සාකච්ඡාවට ගන්න ලදී. මෙම ආයතනයට අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බැවින් කොළඹ විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක කේ ඊ ඩබ්. ජයසිරි මහතා රැස්වීමේ කැඳවුම්කරු ලෙස ක්‍රියා කරන ලදී.

මූලික වගකීම්

විගණන කමිටුවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ආයතනයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කළමණාකරන කටයුතු ඵලදායි ලෙස කරගෙන යාම සඳහා කළමණාකරන මණ්ඩලයට සහය වීමයි.

මූලික වගකීම් වනුයේ ,

1 . මූල්‍ය ප්‍රකාශන ,මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලියේ අඛන්ඩතාවය සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම.

2. ආයතනයේ මූල්‍ය හා ඒ ආශිත කටයුතු වලට අදාල ඕනෑම කාරණයක් පරීක්ෂා කිරීම.

3 . වාර්ෂික වාර්තාව හා අභ්‍යන්තර සැලසුම් හා වැඩසටහන් අධීක්ෂණය කිරීම.

4 . අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන අධීක්ෂණය කිරීම.

5 . බාහිර සහ අභ්‍යන්තර විගණන වාර්තා විමර්ශනය කිරීම සහ නිර්දේශයන්ට සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදු කිරීම

6 . අභ්‍යන්තර පාලන පද්ධති වල ඵලදායි ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම.

වසර තුල ක්‍රියාකාරකම්

2021.01.29 වන දින පැවති රැස්වීමේදී පහත කරුණු පිළිබඳ සාකච්ඡා විය.

1 . නීති සහ රෙගුලාසි සමග අනුකූලතාවය.

බාහිර සහ අභ්‍යන්තර විගණකවරු විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධව සමාලෝචනය කරන ලදී . ආයතනයේ වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී .එසේම ආයතනයට අදාළ සංයුක්ත සැලැස්ම ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ අවශ්‍යතාවයද සාකච්ඡා කරන ලදී

2 . අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම හා ශක්තිමත්කිරීම

ස්ථාවර වත්කම් පාලනය, වාර්ෂික ගබඩා තොග සමීක්ෂණ / ස්ථාවර වත්කම් සමීක්ෂණ, රාජකාරි ලැයිස්තු ලබා දීම සහ බදවා ගැනීමයන අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දෙන ලදී. තවද විගණකාධිපති විසින් 2021 වර්ෂය තුල නිකුත් කරන ලද විගණන වාර්තා හා විගණන විමසුම් වලින් පෙන්වා දෙන ලද දුර්වලතාවයන් නිවැරදි කිරීමට ගනු ලැබූ පියවරයන් පිලිබඳව සමාලෝචනය කරන ලදී.



ටී.එන්. ඔසන්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

තිරසර සංවර්ධනය සඳහා යෝජනාව

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

1. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 2019 වසරේ දී පිහිටුවනු ලැබූ අතර සෞඛ්‍ය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා අවශ්‍ය කරන මානව සම්පත සම්පූර්ණ කිරීම පිණිස ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධ ආයතන සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දිවයිනේ මිනිස් බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම පිණිස සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම අරමුණ ඉටු කර ගැනීම පිණිස 2020 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. දේශීය වෛද්‍ය විද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පිරිනැමීම තුළින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම වයස් කාණ්ඩවල තැනැත්තන් සඳහා සෞඛ්‍යසම්පන්න දිවිපැවැත්මක් සහතික කිරීමට සහ ඔවුන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට** අනුබල දෙනු ලබයි.

2. ආයතනය ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය අංශය සඳහා සුදුසුකම්ලත් විශේෂඥ වෛද්‍ය උපාධිධාරීන් බිහි කිරීම පිණිස සියලුම ව්‍යායාමවල නිරත වේ. ඒ අනුව ආයතනය මඟින් තත්ත්ව සහතික වැඩසටහන් හරහා විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණුවන්නන්ගේ ඉහළම ගුණාත්මකභාවය පිණිස ශික්ෂණය පිරිනැමීමේ පරමාර්ථය ඇතිව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා තත්ත්ව සහතික මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා සැලසුම් කරමින් සිටින අතර ඒ අනුව ආයතනය මඟින් **ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට සහ ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීමට** අනුග්‍රහය දක්වනු ලැබේ.

3. ආයතනය **සෑම විටම ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාව** පවත්වා ගැනීම පිණිස පියවර ගනු ලබයි.

4. මෑතක දී පිහිටුවන ලද ආයතනයක් ලෙස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම තැනැත්තන් සඳහා ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ තිරසර කළමනාකරණය තහවුරු කිරීම** පිළිබඳ ක්‍රියාවලිය දියත් කරමින් ඇත. මේ සඳහා මූලාරම්භයක් ලෙස, ආයතනය මඟින් කුණු කසළ දිරාපත් වන ද්‍රව්‍ය - වීදුරු, පොලිතීන්/ ප්ලාස්ටික් සහ කඩදාසි ආදී ලෙස වෙන් වෙන් වශයෙන් කාණ්ඩ කර, යෝග්‍ය පරිදි බැහැර කිරීම සඳහා පියවර ගෙන ඇත.

5. ආයතනය ශ්‍රී ලංකාව තුළ දේශීය වෛද්‍ය අංශය තුළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ක්ෂේත්‍ර සඳහා විශේෂඥ වෛද්‍ය උපාධි පිරිනමනු ලබයි. මෙම විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා විවිධ ජාතීන්ට අයත් පුහුණුවන්නන් සහභාගී වෙයි. මේ වන විට ආයුර්වේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පමණක් ආරම්භ කර ඇති අතර නුදුරු අනාගතයේදීම යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීම පිණිස පියවර ගෙන ඇත. තව ද, සිද්ධ පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් ද ඉතා ඉක්මනින් හඳුන්වාදීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ඉටු කරමින් තිබේ. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විවිධ ජාතීන් සහ ආගම්වලට අයත් පුහුණුවන්නන් අතර අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගීම පිණිස අවශ්‍ය සියලුම පියවර ගනු ලබයි.

6. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පිරිනමනු ලබන සියලුම විශේෂඥ වෛද්‍ය උපාධිවල පශ්චාත්-විශේෂඥ උපාධි වැඩසටහනේ අවසන් වසර සඳහා එක් අවුරුදු විදේශීය පුහුණුවක් ඇතුළත් වේ. මේ සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් වෙනත් රටවල අධ්‍යාපන ආයතන සමඟ අවබෝධාත්මක ගිවිසුම්වලට එළැඹීමට සැලසුම් කරමින් ඇත (විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍ය උපාධිධාරීන් සඳහා අවසන් වසර පුහුණුව ලබා ගැනීම පිණිස ඉන්දියාවේ උසස් අධ්‍යාපන ආයතන සමඟ ගිවිසුම්වලට එළැඹීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හරහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් එහි ශිෂ්‍යයින්ට සහ කාර්ය මණ්ඩලයට ජාතික සහ අන්තර්ජාතික සබඳතා ගොඩනඟා ගැනීම සඳහා අවකාශය සලසා දෙනු ලැබේ.)